පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 290

ආයතනයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යාවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 290

நிறுவனத்தின் பெயர் : மாவட்ட செயலகம் - மொனராகலை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary n Series No : 290**

**Name of the institution : District Secretariat - Monaragala**

**Submitting observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms Standing Orders 119 (4)**

ඇමුණුම 01

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර නියෝග 119 (4) සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 290**

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ;- මොනරාගල**

| රා.ගි.කා. සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මගපෙන්වීම් | ගණන්දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග | වර්තමාන ප්‍රගතිය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම | නිලධාරීන් දැනුවත් කරන ලදි. | ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු සිගාස් වැඩසටහනෙහි යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් ලද පසු යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. |
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම | නිලධාරීන් දැනුවත් කරන ලදි | යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇතත් නියමිත ආකෘතිය භාවිතා කර නොතිබුණි. මේ පිළිබඳව නිලධාරීන් දැනුවත් කරන ලදි. | 2024 වර්ෂයේ සිට නියමිත ආකෘතිය භාවිතා කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. |
| විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සඳහා මාසයක් ඇතුලත දී පිළිතුරු ඉදිරිපත් නොකිරීම | පිළිතුරු ලබා දීමට කල්ගත වන අවස්ථාවන්වල දී අතුරු පිළිතුරු යැවීමට කටයුතු කිරීම.<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන විමසුම්වලට අදාළ සියළු නිලධාරීන් කැඳවා විගණන සාකච්ඡාවන් පවත්වා කඩිනමින් පිළිතුරු ලබා ගැනීම.<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් තැපැල් මගින් පිළිතුරු ලැබීමට පෙර විද්‍යුත් තැපැල මගින් පිළිතුරු ගෙන්වා ගැනීම.<br><br>විගණන විමසුම් ලද වහාම කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම. | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම අවම කර ගැනීමට කටයුතු සිදුකර ඇත. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුලත දී පිළිතුරු ඉදිරිපත් නොකිරීම | මේ පිළිබඳව අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම අවම කර ගැනීමට කටයුතු සිදුකර ඇත. |

| | | |
|---|---|---|
| විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස් වී නොතිබීම | අදාල කාල සීමාව තුල රටෙහි පැවැති අර්බුදකාරි වාතාවරණය නිසා නියමිත පරිදි විගණන කමිටු පැවැත්වීමට නොහැකි වී ඇත. | විගණන කළමනාකරණ කමිටු නියමිත පරිදි පවත්වා ඇත. . |
| 2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදි මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම | අදාල චක්‍රලේඛයේ ප්‍රකාරව 2018 වර්ෂයේදි මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. | 2023.08.24 දිනැති අංක 06/2023 වත්කම් චක්‍රලේඛය අනුව අදාල තොරතුරු වාර්තා කර ඇත. |
| වාහනයක් ගර්හිත වී මාස 08ට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබීම | මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතුව තිබූ ගර්හිත වාහන 2022.12.21 දින අපහරණය කිරීමට කටයුතු කර ඇත. | අපහරණ කටයුතු සිදු කර ඇත. |
| බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබීම | අදාල කාල සීමාව තුල රටෙහි පැවැති අර්බුදකාරි වාතාවරණය නිසා බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. මේ පිළිබඳව නිලධාරීන් දැනුවත් කරන ලදි. | මේ වන විට නියමිත දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වු ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබීම. | අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වු ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| වර්ෂයකට වැඩි කාලයක සිට හිඟහිටි ණය ශේෂ පැවතීම | පළාත් සභා ණය ශේෂ අයකර අවසන් කර ඇත.<br>මියගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ, ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය අනුව අයකර ගැනීම සඳහා නීතිපති උපදෙස් ඉල්ලා ඇත. එක් නිලධාරියෙකුගේ ණය ශේෂ අයකර අවසන් කර ඇත.<br>වැඩ තහනම් නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ මාසිකව අයකර ගැනිමට කටයුත කර ඇත. එක් නිලධාරියෙකුගේ ණය ශේෂ අයකර අවසන් කර ඇත. | <u>ණය ශේෂ විස්තරය</u><br>2021.12.31 හිඟහිටි ණය ශේෂය රු.2,008,325,.75<br>මෙතෙක් අයකර ඇති මුදල රු.410,017,.51<br>2024.03.31ට හිඟ ණය ශේෂය රු.1,598,308.24 |

| | | |
|---|---|---|
| | සේවය අතහැර ගිය එක් නිලධාරියෙකුගේ ණය ශේෂ මාසිකව අයකර ගැනීමට කටයුතු කර ඇත. නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ අයකර අවසන් වී ඇත. | |
| කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු නොකිරීම | අදාල අංශ දැනුවත් කර නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම හා නිරවුල් කළ නොහැකි තැන්පතු රජයේ ආදායමට බැර කිරීම | එක් තැන්පතුවක් හැර අනිකුත් තැන්පතු ශේෂ නිරවුල් කර ඇත. එම තැන්පතු මුදල් භාවිතා කර අදාල මාර්ග ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍ය ස්ථානයන්හි උරහිස් පිරවීමට ඇති හැකියාව පිළිබඳ පරීක්ෂා කර බලා වාර්තා කරන ලෙස දිස්ත්‍රික් ඉංජිනේරු වෙත දැනුවත් කර ඇති අතර ඔහුගේ වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරමි. |
| මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ඇතුලත නිරවුල් කර නොතිබීම | තත්ත්කාර්ය අතුරු අග්‍රිම, කාර්ය නිම වී දින 10 ඇතුලත නිරවුල් කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. | ලබා ගන්නා ලද අතුරු අග්‍රිමවලින් වැඩි ප්‍රමාණයක් කාර්යය නිම වූ වහාම පියවීමට කටයුතු කර ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ වීම | 2021.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6 ඡේදයේ පෙන්වා දී ඇති කරුණුවලින් වන බලපෑම හැරුණු කොටගෙන එදිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මූල්‍ය ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව විගණනයෙන් දරන්නා වූ මතය වේ. ( යටත්ව මතය)<br><br>( ඇමුණුම 01 ) | 2022 වර්ෂයේදී මෙම කාර්යාලයට අදාල ගිණුම් පිළිබඳව, පැහැදිලි මතයක් විගණනයෙන් ලැබී ඇත.<br><br>( ඇමුණුම 02 ) |

| | | |
|---|---|---|
| විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සියළු නිලධාරීන් දැනුවත් කර ඇත.<br>වෙනත් ආයතන මැදිහත් වීම මත නිරවුල් කළ යුතු කරුණු සඳහා අදාල ආයතන දැනුවත් කර ඇත. | බොහෝ නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර අනිකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |
| නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156(1) ප්‍රකාරව අයකිරීම් කර නොතිබීම. | රජයට සිදු වූ පාඩු වෙනුවෙන් අයකර ගැනීම් සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත | අංක 59-9495 වාහනයට අදාල පාඩුව හැර අනිකුත් සියළුම අයකිරීම් සිදු කර ඇත. |

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
[illegible]

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුළ දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍ය සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය

ඇමුණුම - 01

NAOSL

එම්එන්ජී/ඒ /ඩීඑස්එම්/ඒපීආර්/
2022/16

2022 මැයි

ගණන් දීමේ නිලධාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මොනරාගල

**මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 26 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, එම මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

යූපීසීජී/එම්ජී/ඒ/ඩීඑස්/ඒජීආර්/2022

ගණන් දීමේ නිලධාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

**ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

ශීර්ෂය 277 - මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොණරාගල දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 24 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.